පුවතට සෘජුව අදාළ නොවන අවස්ථාවන් හිදී පුද්ගලයින්ගේ වාර්ගිකත්වයන් ඉස්මතු නොකරන ලෙසත්, භාවාතිශය ලෙස පුවත් වාර්තා නොකරන ලෙසත් මාධ්‍ය ආචාර ධර්ම නිර්දේශයන් තුළ සඳහන් වේ. නමුත් මෙම ආචාර ධර්මයන්ට අනුකූල නොවන වාර්තාකරණයන් ද ඇතැම් විටක දක්නට ලැබේ.

"සුරූපී නර්තනවේදිනියගේ මරණය තවමත් අභිරහසක්" යන සිරස්තලය යටතේ සිළුමිණ (පෙබරවාරි 21, 2022) පුවත්පතෙහි පළ වූ ලිපියකි. පසුගිය දිනෙක දිවි තොර කරගත් තරුණියක් පිළිබඳව එම ලිපිය ලියැවී තිබූ අතර, එම තරුණියගේ පෙම්වතාව සිටි බවට පැවසෙන පුද්ගලයෙකු පිළිබඳව තොරතුරුද වාර්තා කර තිබිණි. මෙම ලිපිය පිළිබඳව අපගේ නිරීක්ෂණයන් මෙසේයි.

1. තරුණියගේ පෙම්වතා "මුස්ලිම් ව්‍යාපාරිකයෙකු" බව ලිපියෙහි සඳහන් වේ. එම තැනැත්තාගේ වාර්ගිකත්වය පුවතට අදාළ වන්නේ කෙසේද?

2. දිවි තොර කරගත් තරුණිය "සුරූපී" නර්තනවේදිනියක් බවද දක්වා තිබුණි. දිවි තොර කරගත් තරුණියක් "සුරූපී" බව සඳහන් කරමින් ඇයගේ බාහිර රූපය ඉස්මතු කිරීම කෙතරම් යෝග්‍ය වේද? එය පුවතට අදාළ වේද?

හදිසි උපකාරක අංක:
*1333-CCCline
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926

මූලාශ්‍ර:
https://accountablejournalism.org/.../nuj-race-reporting...
https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf...
https://media.samaritans.org/.../Guidance_for_reporting...
https://unesdoc.unesco.org/ark:/48223/pf0000180707